## මාන්තෙයි බටහිර ප්‍රාදේශිය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 12 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 11 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

#### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කර නොතිබුණි.

##### 1.3.2 ගණකාධිකරණ අඩුපාඩු

වත්කම් සහ වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි නිරීක්ෂණය වූ ගණකාධිකරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශනයන් මත බලපෑම | වත්කම් | | වියදම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 5,020,000 | - | - |
| අඩුවෙන් දැක්වීම් | 01 | 1,205 | 01 | 25,042 |

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,575,432 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් හි විධිවිධාන වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| i. | ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන)රීති - 1988 III පරිච්ඡේදයේ 66 වගන්තිය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| ii. | III පරිච්ඡේදයේ 65 වගන්තිය | - ආදායම් ලිපිකරු විසින් පැහැර හැර් අයගේ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 581,140 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු. 510,464 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2011 | |
|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය |
| | රු'000 | රු' 000 |
| කල්බදු කුලී | 4,958 | 3,690 |
| බලපත්‍ර ගාස්තු | 151 | 130 |
| වෙනත් ආදායම් | 10,472 | 10,163 |
| | 15,581 | 13,983 |

2.2.2 උසාවි දඩ

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ වෙනත් ආයතනයන් ගෙන් අයවිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය රු. 240,325 ක් විය.

2.3 අරමුණු වලට පරිබාහිර ව ක්‍රියාකාරකම්

පළාත් පාලන කොමසාරිස්වරයා ගේ අනුමැතිය නොමැතිව උතුරු නැගෙනහිර පළාත් සේවා සංවර්ධන ව්‍යාපාතියේ (නෙල්සිප් ) කටයුතු සඳහා රු. 86,214 ක් වූ ආහාර පාන වියදම් ගෙවා තිබුණි.

2.4 පාඩු සහ හානි

විගණන පරීක්ෂණයන් හිදී සහ සභාව පවත්වා තිබුණු තොරතුරු අනුව රු. 87,586 ක් වූ පාඩු සහ හානි අනාවරණය විය.

2.5 කාර්ය සාධනය

සභාව මුදල් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක පිළියෙල කර නොතිබුණි. එම නිසා සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු සහ ඒවායේ ප්‍රගතිය සොයා දැනගත නොහැකි විය.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් රැස් කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ප්‍රදාන
(ඈ) වාහන
(ඉ) ආපසු ගෙවිය යුතු තැන්පතු